# Royal College - Colombo 07
# රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 11 - Third Term Test - November 2020

අවසාන වාර පරීක්ෂණය - 2020 නොවැම්බර් - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time : 1 Hour

## Agriculture & Food Technology I
## කෘෂි හා ආහාර තාක්ෂණය I

| 81 | S | I |
|---|---|---|

Name :- ................................................ Grade :- ....................... Index Number:- .................

❖ **නිවැරදි පිළිතුර තෝරන්න**

01. කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යාමට ඉදිකරන ලද ජය ගඟ හෙවත් යෝධ ඇල ඉදි කරන ලද්දේ,

i. වසභ රජතුමා
ii. ධාතුසේන රජතුමා
iii. මහා පරාක්‍රමබාහු රජතුමා
iv. මහසෙන් රජතුමා

02. ශ්‍රී ලංකාවේ පහතරට අතරමැදි කලාපයට ලැබෙන වාර්ෂික වර්ෂාපතනය

i. මිමී 2500 ට වැඩි
ii. මිමී 900 - මිමී 1750 අතර
iii. මිමී 1750 - මිමී 2500 අතර
iv. මිමී 1750 ට අඩු

03. පසෙහි කැටායන හුවමාරු ධාරිතාව ඉහළ නැංවීමට දායක වන පාංශු සංඝටකය,

i. රොන්මඩ හා හියුමස්
ii. රොන්මඩ හා මැටි
iii. රොන්මඩ හා සියුම්වැලි
iv. මැටි හා හියුමස්

04. නයිස් යනු ශ්‍රී ලංකාවේ සුලබ විපරීත පාෂාණයකි. මෙය සෑදෙන්නේ කුමන පාෂාණය විපරීත වීමෙන් ද?

i. ග්‍රැනයිට්
ii. ක්වාට්ස්
iii. ඩොලමයිට්
iv. පෙග්මටයිට්

05. ශාක කුල අනුව බෝග වර්ගීකරණය පිළිබඳ තොරතුරු පහත දැක්වේ. මෙම ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

A - වැටකොළු, පතෝල, කරවිල, කුකබිටේසියේ කුලයට අයත්ය.

B - බටු, මිරිස්, තක්කාලි, සොලනේසියේ කුලයට අයත්ය.

C - මුං, කවුපි, දඹල, මැල්වේසියේ කුලයට අයත්ය.

i. A හා C
ii. A හා B
iii. B හා C
iv. A,B හා C

6. පොල් බෝගය තනි වගා වළවල් වල සිටුවීමට නිර්දේශ කර ඇත. ඒ සඳහා නිර්දේශිත වගා වළක විශාලත්වය සෙන්ටිමීටර,

i. $60 \times 60 \times 60$
ii. $15 \times 15 \times 15$
iii. $90 \times 90 \times 90$
iv. $30 \times 30 \times 30$

07. උදුරා සිටුවීමට ඔරොත්තු නොදෙන බෝග සඳහා යෝග්‍ය තවාන් වර්ගය,
 i. ඩැපොග් තවාන   ii. සමූහ බඳුන් තවාන
 iii. පාත්ති තවාන   iv. නොරිදෝකෝ තවාන

08. පහත ජල සම්පාදන ක්‍රම අතුරින් වැඩිම ජල ප්‍රමාණයක් අවශ්‍ය වන ක්‍රමය,
 i. ඉසින ජල සම්පාදනය   ii. පිටාර ජල සම්පාදනය
 iii. ඇලි ජල සම්පාදනය   iv. බේසම් ජල සම්පාදනය

09. රතු දුඹුරු පැහැති ස්ඵටික, ජලයේ හොඳින් දියවේ. මෙම රසායනික පොහොර වර්ගය,
 i. මියුරේට් ඔෆ් පොටෑෂ්   ii. ට්‍රිපල් සුපර් පොස්පේට්
 iii. යූරියා   iv. රොක් පොස්පේට්

10. කුකබිටේසියේ කුලයේ බෝගවල පත්‍ර හා මුල් වලට හානි පමුණුවන පූර්ණ රූපාන්තරණය සහිත කෘමි පළිබෝධකයෙකු වනුයේ,
 i. ඉල් මැස්සා   ii. කූඩිත්තා
 iii. අවුලකපෝරා   iv. එපිලැක්නා

11. සහතික කරන ලද බිත්තර වී බීජ වල තිබිය යුතු ප්‍රරෝහණ ප්‍රතිශතය අවම ලෙස,
 i. 90%   ii. 99%
 iii. 95%   iv. 85%

12. බෝග වගාව සඳහා කරනු ලබන බිම් සැකසීම පිළිබඳව වැරදි ප්‍රකාශය තෝරන්න.
 i. අතුරුයත්ගෑම සිදුකරන්නේ බෝග සංස්ථාපනයට පෙරය.
 ii. බිම් සැකසීම මගින් බෝග වර්ධනයට හිතකර පාංශු තත්ත්ව සපයයි.
 iii. මනාව බිම් සැකසීම මගින් වල් පැළ පාලනය වේ.
 iv. බිම් සැකසීමෙන් පසෙහි ජල අවශෝෂණ හැකියාව දියුණු වේ.

13. තවානක පැළ දැඩි කිරීම සඳහා යොදාගන්නා ක්‍රියාමාර්ගයකි.
 i. තවානට සම්පාදනය කරන ජලය සමග දියර පොහොර යෙදීම.
 ii. පැළ ගැලවීමට පෙර දිනයේදී තවානට දිලීරනාශක යෙදීම.
 iii. තවාන සූර්යාලෝකයට නිරාවරණය කෙරෙන පැය ගණන ක්‍රමයෙන් වැඩි කිරීම.
 iv. තවානට නිතර ජලය සම්පාදනය කිරීම.

14. ස්වාභාවික කොළ පොහොර ලෙස භාවිතා කළ හැකි ගුණාත්මක බවෙන් ඉහළ ද්‍රව්‍යකි.
 i. වියළි බිමට වැටෙන ශාක පත්‍රය.   ii. හොඳින් මේරූ අමු ශාක පත්‍රය.
 iii. ළපටි ඉපිල් ඉපිල් පත්‍රය.   iv. අඩක් මේරූ ග්ලිරිසීඩියා පත්‍රය.

15. එළවළු හා පළතුරු වලට "ඇන්ත්‍රැක්නෝස්" රෝගය වැළඳීමට හේතුවන රෝගකාරක දිලීරය.
 i. ෆියුසේරියම්   ii. කොලෙටොට්‍රිකම්
 iii. රයිසොක්ටෝනියා   iv. පීතියම්

16. ගොයම් පැළෑටියේ ප්‍රජනක අවධිය ලෙස හඳුන්වන්නේ,
   i. බීජ ප්‍රරෝහණයේ සිට පුෂ්ප මූලාකෘති ඇතිවීම දක්වා කාලය.
   ii. පුෂ්ප මූලාකෘති ඇතිවීමේ සිට පීදීම දක්වා කාලය.
   iii. පුෂ්ප මූලාකෘති ඇතිවීමේ සිට අස්වනු මේරීම දක්වා කාලය.
   iv. පීදීමේ සිට අස්වනු මේරීම දක්වා කාලය.

17. කෘමි පළිබෝධ පාලනයේදී වැදගත් වන ස්වාභාවික සතුරන් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   i. ලේඩිබර්ඩ්, සුදුමැස්සා, කුඩිත්තා
   ii. බත්කූරා, දිමියා, පිටි මකුණා
   iii. පැළමැක්කා, වන්දා, මකුළුවා
   iv. දිමියා, මකුළුවා, වන්දා

18. බිගෝනියා, පෙපරෝමියා, සැන්සිවේරියා යන විසිතුරු පත්‍රික ශාක ප්‍රචාරණයට වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
   i. පත්‍ර කැබලි සිටුවීම
   ii. මුල් කැබලි සිටුවීම
   iii. දඬු කැබලි සිටුවීම
   iv. අතු බැඳීම

19. අපිභෞම ප්‍රරෝහණය දක්වන බීජ වර්ග අයත් කාණ්ඩය කුමක්ද?
   i. වී, කඩල, බඩඉරිඟු
   ii. මුං, කඩල, බටු
   iii. මුං, බෝංචි, බටු
   iv. බටු, මිරිස්, වී

20. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේදී යොදා ගැනෙන තාවකාලික ආරක්ෂිත වගා ව්‍යුහයකට උදාහරණයකි.
   i. පොලිතීන් උමං
   ii. දැල් ගෘහය
   iii. සූර්ය ප්‍රචාරකය
   iv. වීදුරු ගෘහය

21. එකම භූමියක බෝග වගාව, සත්ත්ව පාලනය, බලශක්තිය නිෂ්පාදනය ඒකාබද්ධව සිදුකිරීම හඳුන්වන්නේ.
   i. ශෂ්‍ය බෝග මාරුව
   ii. සමෝධානිත ගොවිතැන
   iii. වීදි බෝග වගාව
   iv. හේන් ගොවිතැන

22. පොල් වගා කර ඇති භූමියක අතුරුබෝගයක් ලෙස වගා කළ හැක්කේ කුමන බෝගයද?
   i. අඹ
   ii. දෙල්
   iii. කෝස්
   iv. අන්නාසි

23. වම්බටු ශාක පත්‍රවල නාරටි, දැලක් ආකාරයට ඉතිරිවන සේ පත්‍ර කා දමන කෘමියා,
   i. එපිලැක්නා
   ii. ඉල් මැස්සා
   iii. අවුලකපෝරා
   iv. පළතුරු මැස්සා

24. ස්වාභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යුහයක් වන බල්බිල දක්නට ලැබෙනුයේ කුමන ශාකයේද?
   i. අර්තාපල්
   ii. ලොකු ළූණු
   iii. ගොටුකොළ
   iv. ගෝනිගස් (හණ)

25. ''පසු අස්වනු තාක්ෂණයේ'' ප්‍රධාන අරමුණ නම්,
   i. අස්වනු නෙළීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම.
   ii. පසු අස්වනු සාධක කළමනාකරණය මගින් අස්වනු හානිය අවම කිරීම.
   iii. අස්වනු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් පෙට්ටි භාවිතා කිරීම.
   iv. අස්වනු ගබඩා කිරීමට ශීතකාමර භාවිතා කිරීම.

26. ආහාර ඇසුරුම හා ඒ තුළ අන්තර්ගත කර ඇති ආහාර ද්‍රව්‍යය ඉහළ උෂ්ණත්වයකට පත් කර පරිරක්ෂණය කරනු ලබන්නේ,
   i. රික්ත තත්ව යටතේ ඇසිරීමේදීය.
   ii. නවීකෘත අභ්‍යන්තර පරිසර තත්ත්ව යටතේ ඇසිරීමේදීය.
   iii. අපූති තත්ත්ව යටතේ ඇසිරීමේදීය.
   iv. වාත ප්‍රතිරෝධ තත්ත්ව යටතේ ඇසිරීමේදීය.

27. සමහර පුද්ගලයන්ට ඇතැම් ආහාර අනුභව කිරීමෙන් ආසාත්මික තත්ත්ව ඇතිවේ. එවැනි ආහාර වනුයේ,
   i. ඉස්සන් හා තක්කාලි
   ii. පාන් හා බඩ ඉරිඟු
   iii. බටර් හා කිරි
   iv. අර්තාපල් හා කිරි අල

28. බීජාවරණයෙහි වර්ධක නිෂේධක ද්‍රව්‍ය අඩංගු වීම නිසා ප්‍රරෝහණය ප්‍රමාද වන බීජ වර්ගයකි.
   i. බඩ ඉරිඟු
   ii. පැපොල්
   iii. සියඹලා
   iv. අඹ

29. මව් ශාකයේ ලක්ෂණ සහිත පැළ අති විශාල සංඛ්‍යාවක් නිපදවා ගත හැකි ප්‍රචාරණ ක්‍රමය.
   i. දඬු කැබලි සිටුවීමය.
   ii. අතු බැඳීමය.
   iii. බද්ධ කිරීමය.
   iv. පටක රෝපණය.

30. දියර කිරි පරිරක්ෂණය නිවැරදිව දක්වා ඇති වරණය කුමක්ද?
   i. දියර කිරි අධිශීතනයෙන් යෝගට් සෑදීම.
   ii. දියර කිරි ජීවානුහරණයෙන් චීස් සෑදීම.
   iii. දියර කිරි විසිරි වියලීම මගින් කිරිපිටි සෑදීම.
   iv. දියර කිරි සාන්ද්‍ර කිරීම මගින් මුදවාපු කිරි සෑදීම.

31. පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) ගණනය කිරීම සඳහා අවශ්‍ය වන මිනුම් වනුයේ,
   i. ශරීර බර හා උස
   ii. රුධිරයෙහි අඩංගු සීනි ප්‍රමාණය හා උස
   iii. උස හා ඉනෙහි වට ප්‍රමාණය
   iv. උපත් බර හා වයස

32. මිනිසාට සෙලියුලෝස් ජීරණය කළ නොහැකි වුවද එය ආහාරයක අඩංගු විය යුතු ප්‍රධාන කාබෝහයිඩ්‍රේට් වර්ගයකි. හේතුව,
   i. ශක්ති ප්‍රභවයක් වන බැවිනි.
   ii. සංචිත පිෂ්ඨය සහිත ආහාරයක් බැවිනි.
   iii. සෛල බිත්ති නිර්මාණය කිරීමට දායක වන බැවිනි.
   iv. මළ බද්ධය වළක්වන බැවිනි.

33. එළ ගව වර්ග අතරින් මනා පාලනයක් යටතේ වැඩිම කිරි නිෂ්පාදනය ලබා දෙන ගව වර්ගය.

i. රතු සින්දි    ii. සහිවාල්
iii. ජර්සි    iv. ෆ්‍රිෂියන්

34. පැලුම් රිකිලි බද්ධය සිදුකිරීමෙන් පසුව අනුජය පොලිතීන් කවරයකින් ආවරණය කරනුයේ,

i. අනුජයට පළිබෝධ ඇතුල්වීම වැළැක්වීමටය.
ii. අනුජයෙන් ජලය උත්ස්වේදනය වැළැක්වීමටය.
iii. අනුජයට ජලය ඇතුල්වීම වැළැක්වීමටය.
iv. අනුජයට සුළඟ මගින් සිදුවන හානි වැළැක්වීමටය.

35. ආහාර නරක් වීම කෙරෙහි බලපාන සාධක, භෞතික, රසායනික සහ ජීව විද්‍යාත්මක සාධක වශයෙන් බෙදා දැක්විය හැකිය. මෙයින් නරක් වීමට බලපාන රසායනික සාධකයක් වන්නේ,

i. ආහාරයේ තෙතමනය
ii. ආහාර මත දිලීර වර්ධනය
iii. පරිසර උෂ්ණත්වය
iv. ආහාර තුල සිදුවන එන්සයිමීය ක්‍රියාවන්

36. ශ්‍රී ලංකාවේ ඇති කරනු ලබන විදේශීය සම්භවයක් සහිත නළල හා පාද කෙලවර හා වලිගය කෙලවර සුදු පැහැති මී ගව වරිගය වනුයේ,

i. මූරා    ii. සූර්ති
iii. නිලිරවි    iv. අයර්ශයර්

37. ගව දෙනකගේ මද චක්‍රය දින,

i. 21    ii. 30
iii. 285    iv. 305

38. නිදිබරව එකට ගුලිවී සිටින කුකුල් පැටවුන්ගේ ගුද මාර්ගය අවට සුදු පැහැති මල ද්‍රව්‍ය බදාමයක් සේ ඇලී තිබෙන දක්නට ලැබුණි. මොවුන්ට වැලදී ඇති රෝගය.

i. කොක්සිඩියෝසිස්    ii. පුල්ලෝරම්
iii. රැනිකට්    iv. වටපණු ආසාදන

39. සත්ත්ව පාලනයේදී ප්‍රෝටීන් ප්‍රභවයක් ලෙස සතුන්ට ලබා දෙන ආහාරයක් වනුයේ,

i. බඩ ඉරිඟු    ii. තෘණ
iii. පුන්නක්කු    iv. සහල් නිවුඩු

40. ගව පැටවකු ඉපදුනු විගස පළමුවෙන්ම කළ යුතු සත්කාරය වනුයේ,

i. මුල් කිරි (කොලෙස්ට්‍රම්) බීමට සැලැස්වීමයි.
ii. පෙකනිවැල කපා අයඩීන් අලේප කිරීම.
iii. නාසයේ හා මුඛයේ ඇති ශ්ලේෂ්මල පිස දැමීමයි
iv. ජලය ස්වල්පයක් බීමට සැලැස්වීමයි.

# Royal College - Colombo 07
## රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 11 - Third Term Test - November 2020

අවසාන වාර පරීක්ෂණය - 2020 නොවැම්බර් - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 Hour

# Agriculture & Food Technology II
# කෘෂි හා ආහාර තාක්ෂණය iI

| 81 | S | II |
|---|---|---|

Name :- ................................................ Grade :- ....................... Index Number:- .................

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. පාසල් ගොවිපළ සෑදීමේදී බිම පිළියෙල කිරීම, බෝග තේරීම, පස සංරක්ෂණය කිරීම පිළිබඳව කෘෂිවිද්‍යා ගුරුතුමා සිසුන් දැනුවත් කළේය. පාසැල් භූමියේ පස මැටි සහිත නිසරු පසකි. එය සාරවත් කළ යුතු බවට ගුරුතුමා සිසුන් දැනුවත් කළේය.
   - i. මෙම ගොවිපළේ මූලික බිම් සැකසීම සඳහා භාවිතා කරන උපකරණ 4 ක් නම් කරන්න.
   - ii. මෙම ගොවිපළේ එළවළු වගා කිරීමට සුදුසු පාත්ති වර්ග 2 ක් ලියන්න.
   - iii. බීජ තවාන් දමා සිටුවන එළවළු බෝග වර්ග 02 ක් ලියන්න.
   - iv. තවානක් සඳහා තවාන් මිශ්‍රණයට භාවිතා කරන ද්‍රව්‍යය හා යොදන අනුපාත ලියන්න.
   - v. ගොවිපළේ වගා කිරීමට සුදුසු සොලනේසියේ කුලයේ බෝග වර්ග 2 ක් නම් කරන්න.
   - vi. සොලනේසියේ කුලයේ බෝග වලට නිතර වැලඳෙන බැක්ටීරියා රෝගයක් ලියන්න.
   - vii. වගාබිමට ලැබෙන ජලය සීමිත බැවින් සුදුසු ජල සම්පාදන ක්‍රම 2 ක් ලියන්න.
   - viii. ගොවිපළේ භූගත කඳන් සහිත වල් පැළෑටි පාලනය සඳහා අනුගමනය කරන යාන්ත්‍රික ක්‍රමයක් හා රසායනික ක්‍රමයක් ලියන්න.
   - ix. පස සරු කිරීමට යොදාගත හැකි පූර්ණ පොහොර මිශ්‍රණයක අඩංගු වන ප්‍රධාන පෝෂක වර්ග 3 නම් කරන්න.
   - x. මෙහි නිෂ්පාදිත එළවළු වෙළඳපොලට සැපයීම සඳහා සුදුසු අසුරණ ක්‍රම 2 ක් ලියන්න.

(ලකුණු $2 \times 10$ - 20)

02. තවාන් පැල නිපදවීමට ගොවියෙක් දිග 3m ක් ද පළල 90cm ද උස 12cm පාත්ති සකස් කරන ලදි. එය මත තවාන් මිශ්‍රණය 3cm උසට අතුරන ලදි.
   - i. a) මෙම තවාන් වර්ගය හඳුන්වන නම කුමක්ද?
     b) මෙම තවාන් මිශ්‍රණය සඳහා යොදන ද්‍රව්‍ය මොනවාද?
   - ii. තවාන ජීවානුහරණය කරන ක්‍රමය ලියන්න
   - iii. a) තවානේ සිටුවන බීජ වර්ග 3 ක් ලියන්න.
     b) තවාන් දමා පැළ සිටුවීමෙන් ලැබෙන වාසි 2 ක් ලියන්න.
   - iv) බඳුන් තවාන් සෑදීමේදී බඳුනක් පුරවන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 10)

03. ශිෂ්‍යයෙක් තම ගෙවත්තේ ඇති මිරිස් වගාවේ පැළ මැලවී තිබෙනු දැක පස ජලයෙන් සංතෘප්ත වන තුරු ජලය සම්පාදනය කළේය.
   - i. a) පස ජලයෙන් සංතෘප්ත වන අවස්ථාවේ පසේ පවතින ජල වර්ග 3 ලියන්න.
     b) මිරිස් පැළ මැලවී තිබෙන අවස්ථාවේ පසේ ඇති ජල වර්ගය කුමක්ද?
   - ii. වගාවට ජලය සපයා පැය 48 කින් අතිරික්ත ජලය බැස ගිය පසු පාංශු ජලය බෝග වගාවට ඉතාම හිතකර තත්වයට පත්වේ. මෙම අවස්ථාවේ පස හඳුන්වන්නේ කුමන නමකින්ද?

iii. a) පස ජලයෙන් සංතෘප්ත වන විට පාංශු වාතය ඉවත් වේ. බෝග වගාවට පාංශු වාතයෙන් ඇති ප්‍රයෝජනයක් ලියන්න.

b) බෝග වගාවේදී පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ඇති ප්‍රයෝජනයක් ලියන්න.

iv) පාංශු පැතිකඩක රූප සටහනක් ඇඳ නම් කරන්න.

(ලකුණු 10)

04. ගොවි මහතෙක් තම එළවළු වගාවේ කෘමියෙක් නිතරම ගැවසෙනු දුටුවේය. කෘමියා එල තුළ බිත්තර දමා ඇති බව නිරීක්ෂණය කළේය.

i. a) මෙම කෘමියාගේ නම කුමක්ද?

b) මෙම කෘමියා හානි කරන බෝග 2 ක් ලියන්න.

ii. එම බෝග වර්ගය අයත් කුලය කුමක්ද?

iii. a) මෙම කෘමියාගේ ජීවන චක්‍රයේ අවස්ථා මොනවාද?

b) බෝග වලට වැඩිපුර හානි කරන්නේ ජීවන චක්‍රයේ කුමන අවස්ථාවද?

iv. මෙම කෘමියා මර්ධනයට පෙරමෝන උගුලක රූප සටහනක් ඇඳ නම් කරන්න.

(ලකුණු 10)

05. බෝග වගාවේදී පෝෂණ ඌනතා මඟහරවා ගැනීමට පොහොර යොදයි.

i. a) බෝග වල පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍යය 4 ක් ලියන්න.

b) පොටෑසියම් හිඟවීමෙන් ශාක වල දක්නට ලැබෙන ඌනතා ලක්ෂණ 2 ක් ලියන්න.

ii. බෝග වල පොටෑසියම් ලබා දීමට යොදන රසායනික පොහොර වර්ගයක් ලියන්න.

iii. a) කෘෂිකර්මාන්තයේ යොදන කාබනික පොහොර වර්ග 4 ක් ලියන්න.

b) කාබනික පොහොර යෙදීමෙන් ඇතිවන වාසි 4 ක් ලියන්න.

iv. බෝග වලට රසායනික පොහොර යෙදීමෙන් ඇති වන අවාසි 2 ක් ලියන්න.

(ලකුණු 10)

06. ගොවිපල සතුන් ඇති කිරීමෙන් සහ සත්ත්ව රෝග පාලනයෙන් උසස් ගුණාත්මක බවින් යුතු වැඩි නිෂ්පාදනයක් ලබා ගත හැකි වේ.

i. ඝන ආස්තරණ ක්‍රමය හෙවත් ඩිප්ලීටර් ක්‍රමයට කුකුලන් ඇති කිරීමේ වාසි 3 ක් ලියන්න.

ii. ගොවිපොල සතුන් සඳහා නිවාසයක් ඉදිකිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න.

iii. ගව දෙනුන්ට වැළඳෙන බුරුළු ප්‍රදාහයේදී

a) බුරුල්ලෙහි සිදුවන වෙනස්කම් දෙකක් ලියන්න

b) කිරි වල සිදුවන වෙනස්කම් දෙකක් ලියන්න.

iv. බුරුළු ප්‍රදාහය පාලනය කිරීමට ගත හැකි උපාය මාර්ග දෙකක් ලියන්න

(ලකුණු 10)

07. බෝග වගා කිරීමේදී වැඩි නිෂ්පාදනයක් ලබාගනු පිණිස විවිධ ගොවිතැන් ක්‍රම අනුගමනය කරයි.

i) a) සමෝධානිත ගොවිතැන යනු කුමක්ද?

b) සමෝධානිත ගොවිතැනෙහි වාසි 4 ක් ලියන්න.

ii. කෘෂි වන වගාවේ වැදගත්කම් 4 ක් ලියන්න.

iii. a) පාලිත තත්ව යටතේ බෝග වගා කිරීමේ වාසි 02 ක් ලියන්න.

b) පාලිත තත්ව යටතේ බෝග වගා කිරීමේදී සාදා ගන්නා ගෘහ වර්ග 2 ක් ලියන්න.

iv. බෝග වගාවේදී යොදාගන්නා වගා රටා 2 ක් ලියන්න.

(ලකුණු 10)